# මහනුවර යුගයෙහි සිංහල කුල ක්‍රමය: සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

ප්‍රභාෂ් සිරිවර්ධන

## ප්‍රවේශය

සමාජය යනු විවිධාකාර චර්යා රටාවන්ගෙන් හිමි පුද්ගල නිර්මිතයක් වන අතර එය සංකීර්ණ වූ මානව සබඳතා හා ආයතනික රටාවන්ගෙන් ව්‍යුහගත වූ සාර්ව ඒකකයකි. මෙකී මානව සබඳතා හා ආයතනික ව්‍යුහයන් ගොඩනැඟී ඇත්තේ එක්තරා රටාවකට වේ. එම රටාව නිර්මාණය වීමෙහිලා පදනම් සාධකයෝ ඒ ඒ සමාජයනට ආවේණික වූවෝ වෙති. බටහිර සමාජය තුළ මෙම පෙළගැසීම නිර්ණය කිරීමෙහිලා මුදල කේන්ද්‍ර කරගත් පන්තිමය සාධකය පදනම් සාධකයක් වන විට ආසියාතික සමාජය තුළ එහිලා "කුලය" පදනම් සාධකය බවට පත්ව ඇත. සමාජ ඓන්ද්‍රියත්වය උදෙසා කුලය සෘජු සාධකයක්ව බවට පත්ව තිබූ ආසියාතික සමාජයෙහි පුද්ගල චර්යාවේ සෑම පැතිකඩක්ම ඒ හා සමඟින් අවියෝජනීය ලෙසින් බැඳී පැවතිනි. ඇතැම් අවධීන්හි මෙම කුලය නම් සාධකය සමාජ ව්‍යුහයෙහි පැවැත්ම උදෙසා අනිවාර්ය හා අත්‍යවශ්‍යතම සාධකයක් බවට පත්විය. ශ්‍රී ලාංකේය සමාජ විකාශනය තුළ මහනුවර යුගය යනු එසේ කුලය මත ව්‍යුහගත වූ සමාජ ක්‍රමයක ප්‍රතිබිම්බයකි. එය එකල්හි සියළු සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සන්දර්භයන් ක්‍රියාත්මක කිරීමෙහිලා පදනම් සාධකය විය. එබැවින් මෙම ලිපියෙහි මුඛ්‍ය අවධානය යොමුව ඇත්තේ සන්දර්භ විශ්ලේෂණයක් ඔස්සේ මහනුවර යුගයෙහි කුල ක්‍රමය පිළිබඳ සංගෘහිත සමාලෝචනයක් සඳහා වේ.

## විමර්ශනය

කුලය යන්න හඳුනාගැනීම සඳහා සාර්ව සාධාරණ හා විශ්වීය නිර්වචනයක් මෙතාක් ගොඩනැංවී නැත. සමාජ විද්‍යාඥයන් අතුරෙහි පිළිගැනීම වන්නේ එය සමාජ ව්‍යුහය තුළ පුද්ගල ආස්ථානය නිරූපණය කරන්නා වූ දැඩි සමාජ ස්ථරායන රටාවක් බවයි. මානව විද්‍යාඥයනට අනුව එය භාරතීය සමාජය තුලින් නිපන් එයට පමණක් ආවේණික වූ සමාජ ක්‍රමයකි.[1] කුලය යන්න ඉන්දියානු සමාජය තුලින් බිහිවූවක් ලෙසින් දක්වන මැක්ස් වෙබර් එය සමාජ ආයතනයක් බවත් එහිලා පදනම් සාධකයෝ වන්නේ හින්දු ආගමික මූලධර්මයන් බවත් දක්වයි. මෙය සනාථ කරමින් ඩුමොන්ට් දක්වන්නේ කුලය යන්න හින්දු ආගමික මූලධර්මයන් පදනම් කොට ගනිමින් ගොඩනැඟුණු හා එමෙන්ම බ්‍රාහ්මණ හා ක්ෂත්‍රීය වංශිකයන්ගේ සහයෝගීත්වයෙන් යුතුව සම්භාවනීයත්වය හා අවශේෂත්වය මත බලය වෙන්කොට තබා ගැනීම උදෙසා ගොඩනැඟුණු සමාජමය අනුපිළිවෙලක් ලෙසිනි[2]. මේ අනුව කුලය යන්න ඉන්දියානු සමාජය තුළ නිර්මාණය වූවකි. එහිදී කුලය යන්න පුද්ගල උපතත් සමඟම තීරණය වන තත්වයක් වන අතර එමෙන්ම එහිලා ගොඩනැංවුණු නිශ්චිත කාර්යභාරයක්ද පවතී. උපතත් සමඟ තීරණය වන කුල තත්වය කිසිම පුගලයකුට ස්වකීය ජීවිත කාලය තුළ වෙනස් කරගත නොහැකි අතර එමෙන්ම එය සමාජ ස්ථරගත රටාව පිළිබිඹු කරන්නා වූ ප්‍රපංචයක්ද වේ. මෙය A.L. Kroeber ට

1 E.R.Leach **"Aspects of Caste in South India"** (Celon and North West Pakisthan Cambridge Papers in Social Antropology1971)

2 L. Dumont - " **Reflection of a Social Anthropologist** "Caste Racism and Stratification " (Contribution to Indian Sociology 1961),5.p

අනුව කුලය පුද්ගලයකුට උත්පත්තියත් සමගම හිමිවන්නා වූ වෙනස් කිරීමකට ලක් කළ නොහැකි දැඩි අනම්‍ය බවකින් යුක්ත වන්නා වූ සමාජමය ආයතනයක් බවයි[3]. මේ අනුව කුලය යන්න දකුණු ආසියාතික සමාජයට අනන්‍ය වූ හා එහිම නිපන් සමාජමය නිර්මිතයක් වේ.

**ශ්‍රී ලංකා සමාජය හා කුලය**

ශ්‍රී ලංකා සමාජය තුළ කුලය බිහිවීම පිළිබඳ නිශ්චිත සාක්ෂි නැත. එහෙත් ලාංකීය සමාජ සංස්කෘතික සන්දර්භයන් හැඩගැසීමෙහිලා ඉන්දීය මැදිහත්වීම් හා බලපෑම් අනිවාර්ය හා තීරණාත්මක සාධකයක් විය. විශේෂයෙන්ම ථේරවාදී බුදුදහමත් සමඟ සිදුවූ මහින්දාගමනයත්, දන්තධාතුන් සමඟ සිදුවූ සංඝමිත්තාගමනයත් මෙරට සමාජ සංස්කෘතික සන්දර්භය කෙරෙහි පරිවර්තනීය බලපෑමක් ඇති කරන්නට සමත් විය. විශේෂයෙන්ම සංඝමිත්තාගමනය සමගින් විවිධ කර්මාන්තයන් හා ශිල්පයන්හි නිරත වූ කුල දහසයකට අයත් ශිල්පීහු මෙරටට පැමිණි බව මහාවංශය දක්වයි[4]. එබැවින් සිංහල කුල ක්‍රමයේ ආරම්භය හා ස්ථාපනය හින්දු කුල ක්‍රමය තුළින් නිපන් බව ඉතිහාසඥයන් දැරූ මතවාදය විය.[5] මෙහිලා බලපෑ පදනම් කාරණාවන් වූයේ බොහෝ ඓතිහාසික ග්‍රන්ථ වල බ්‍රාහ්මණයන් පිළිබඳ කතිකාවන් පැවතීමත් එමෙන්ම ඓතිහාසික මූලාශ්‍රයන් වන සෙල්ලිපි තුළින් කුල ව්‍යුහයන් පිළිබඳ කාරණාවන් මතුකොට දැක්වීමත්ය. මෙහිදී මිහින්තලේ ප්‍රදේශයෙහි පවතින සෙල්ලිපි තුළින් නිශ්චිත වැටුප් හා ගම්මානයන් පැවති වඩුවන් හා රජකයන් වන සමාජ කණ්ඩායම් පිළිබඳ දක්වා ඇත[6].අනෙක් අතට ශ්‍රී ලංකාව නිරන්තරයෙන් දකුණු ඉන්දීය ආක්‍රමණයන්ට මුහුණ දුන් රාජ්‍යයක් විය. මේ හේතුකොට බොහෝ අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය රාජ්‍යයන්හි යටත් රාජ්‍යයක් බවට පත්ව පැවතිනි. මෙවන් අවස්ථාවන්හිදී මෙරටට පැමිණි බොහෝ ආක්‍රමිණකයන් මෙරට පදිංචි වී ඇති අතර ඔවුන් ඉන්දීය සමාජය තුළ විවිධ කුල ස්ථරයන් නියෝජනය කරන්නන් විය. අනෙක් අතට රාජ්‍ය පරිපාලනයේ ඉහළ තනතුරු සඳහා මොවුන් අතරෙහි වූ ඉහළ කුලීනයන්ගේ දායකත්වය ලබාගෙන ඇත. මෙයින් ඉන්දීය කුල අභාශය මෙරට සමාජයට ලැබෙන්නට විය. ඒ අනුව දොළොස්වන සියවස වන විට ගොවිගම, ලෝකුරු, කෙවුල්, බෙරවා ආදී ලෙසින් මෙරට සමාජයට අනන්‍ය වන අයුරින් විවිධ කුල ව්‍යුහයන් නිර්මාණය වී පැවතී බවට ගලපාත විහාර ලිපියෙන් මෙන්ම නිශ්ශංකමල්ල රජු විසින් දක්වා ඇති ගොවි කුලයේ අයෙකුට සිංහාසනයට පත්වීමට ඉඩ නොතැබිය යුතු බවට වූ සෙල් ලිපි පාඨයන් මගින් පැහැදිලි වේ.[7]

අනෙක් අතට ඉන්දියානු ආක්‍රමණයන් හරහා මෙරටට පැමිණි ආක්‍රමණිකයන් විවිධ කුල වලට අයත් වූවා සේම ඔවුන් පසුකාලීනව මෙරට සමාජයට අනුයුක්තව ඇත්තේද ඒ ඒ කුලයන්ට අදාළ කාර්යය කොටස් සිදුකිරීම පහසුවන ලෙසිනි. එනම් ඔවුනගේ වෘත්තීයමය කුසලතාවයනට සමපාත වන පරිදිය[8]. එමෙන්ම පණ්ඩුකාභය රජ සමයේදී අනුරාධපුර නගරය තුළ පැවති විවිධ සේවාවන් සඳහා ජනයා වෙනකොට පදිංචි කොට ඇති අතර ඔවුන් උදෙසා වෙන් වෙන් වශයෙන් ගම් නිර්මාණය කොට ඇත[9]. මේ අනුව මෙරට කුල ක්‍රමය නිර්මාණය වී ඇත්තේ වෘත්තීයමය ස්වරූපයකින් බව හඳුනාගත හැක. ඒ අනුව රාජ්‍ය පරිපාලනයේ විවිධ වූ කාර්යභාරයන් හා සේවාවන් සම්පාදනය පහසුවන අන්දමට මෙරට කුලව්‍යුහය සකස් වී ඇත. එනම් මෙරට කුලව්‍යුහය වැඩවසම් ආකෘතියක් ගනු ලබයි. අනෙක් අතට ඉන්දීය සමාජයේ මෙන් දැඩි පීඩාකාරී ස්වරූපයක් මෙරට කුල සාධකය තුළ හඳුනාගත නොහැකි බව ගොම්බ්‍රිච් (Gombrich) දක්වා ඇති අතර තවදුරටත් මෙරට ප්‍රධාන ආගම වන බුදුදහම මඟින් කුලය විවේචනයට ලක් කිරීමත්, සමස්ත ජනගහනයෙන් ඉතා සීමිත පිරිසක් පමණක් පහලම මට්ටමේ කුල තුළට අන්තර්ග්‍රහණය වීමත් ඒ කෙරේ බලපා ඇත.[10]

**ශ්‍රී ලංකා සමාජයෙහි කුල සංයුතිය**

---

3 ඩී.අමරසේකර, **ශ්‍රී ලංකා සමාජය**. (වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 1998)

4 S.Sumangala Mahawamsa (edited) " Colombo :Buddhist Cultural Center"

5 එම්.බී.ආරියපාල, **මධ්‍යකාලීන ලංකා සමාජය**,( කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව. 1962).

6 එම්.යූ.ද.සිල්වා, **ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය**, (කඩවත:අභය ප්‍රකාශකයෝ 1998).

7 එම්.යූ.ද.සිල්වා, **ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය**, (කඩවත:අභය ප්‍රකාශකයෝ 1998).

8 පී.ගුණවර්ධන, **පුරාන ගම මානව වංශ පුරාවිද්‍යා විමර්ශනයක්**, ( ජා ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ 2004).

9 එම.,

10 කේ.ටී.සිල්වා සහ තවත් අය. **කුලෙන් තොරද? කුල අන්ධද?** (කොළඹ.කුමාරන් බුක් හවුස් 2009).

ඉහත සාකච්ඡා කල අන්දමට මෙරට කුල සාධකයෙහි බිහිවීම හා ව්‍යාප්තිය ඓතිහාසික වශයෙන් සිදුවූ ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය තීරණය වීමෙහිලා බලපා ඇති මුඛ්‍යතම සාධකයක් වනුයේ වැඩවසම් සමාජ මූලධර්මයන්ය. එහිදී ඉන්දීය කුල ප්‍රපඤ්චය තුළ හඳුනාගත හැකි අන්දමේ දැඩි හා පීඩාකාරී ස්වරූපයක් මෙතුල හඳුනාගත නොහැක. එනම් මෙරට කුලව්‍යුහය නිර්මාණය වී ඇත්තේ ඉන්දීය අභාෂයන් මතින් වුවත් මෙරටට අනන්‍ය වූ ගති ලක්ෂණයන් හරහා වේ.[11] ඒ අනුව පරිපාලනමය අවශ්‍යතාවයන් කේන්ද්‍රකරගනිමින් මෙරට නිර්මාණය වී ඇති සිංහල කුල ක්‍රමය තුළ ප්‍රධාන වශයෙන් කුල 15 ක සංයුතියක් හඳුනාගත හැක.

වගු අංක 01

සිංහල සමාජයේ කුල සංයුතිය ( මුළු සිංහල ජනගහනයෙන 100%ට ගණනක් ලෙස)

සිංහල සමාජයේ ක=ල සංයුතිය ( මුළු සිංහල ජන.හනයෙන 100]ට .ණනක් ලෙස)

| අනුපිළිවෙල (පූර්ණඑක ඟතාවයක් නැත) | කුලයේනම | පාරම්පරිකවෘත්තිය | මුළුසිංහලජනගහනයෙන් % ගණනක්ලෙස |
|---|---|---|---|
| 01 | ගොවිගම<br>I. රදල<br>II. ගොවි<br>III. පට්ටි | ඉඩම්හිමිං%භූ<br>ගොවිතැන<br>ගවපාලනය | 0.001<br>49.000<br>0.001 |
| 02 | කරාව | මසුන්මැරීම | 5.000 |
| 03 | සලාගම | කුරුඳුතැලීම | 3.000 |
| 04 | දුරාව | රාමැදීම | 2.000 |
| 05 | හුනු | අලුහුනුකර්මාන්තය | 0.002 |
| 06 | ආචාරි/ගල්ලදු/නවන්දන්න | ලෝකුරුවැඩ | 0.5000 |
| 07 | හේන/රදා | රෙදිඇපිල්ලීම | 3.000 |
| 08 | වහුම්පුර/ හකුරු | හකුරුසැදීම | 12.500 |
| 09 | කුඹල්/බඩහැල | වළන්සෑදීම | 2.500 |
| 10 | දුර<br>I. වෙල්ලදුර/බෝධි<br>II. පන්නදුර | ශ්‍රීමහාබෝධියරැකගැනී ම<br>ඇත්ගොව්වෝ | 0.001 |
| 11 | නැකති/ බෙරවා | නැටුම්/ නවැඩ | 3.000 |
| 12 | බත්ගම/ පදු | සේවකයෝ/<br>බරඋසුලන්නෝ | 18.000 |
| 13 | ගහල | මළබෙරගැසීම | 0.001 |
| 14 | කින්නර | පැදුරුවිවීම/<br>හණකර්මාන්තය | 0.300 |
| 15 | රොඩී | හිඟමන/<br>කොහුඉදල්සෑදීම | 0.001 |
| | වෙනත් | - | 1.193 |
| | එකතුව | | 100.000 |

(උපුටා ගැනීම: සිල්වා, කේ.ටී., 2005. කුලය, පන්තිය හා ලංකාවේ සමාජ ගැටුම්.)

11 කේ.ටී.සිල්වා, සහ තවත් අය. කුලය, පන්තිය හා ලංකාවේ සමාජ ගැටුම්. (බොරලැස්ගමුව :විසිදුනු ප්‍රකාශකයෝ 2005).

මේ ආකාරයට මෙරට කුල ව්‍යුහයේ දළ සංයුතියක් හඳුනාගත හැකිවුව ද මෙම ධූරාවලිය පිලිබඳ නිඝ්ෂිත එකඟතාවයක් මේතාක් ගොඩනැඟී නැත. එක් එක් කාලවකවානුවලට සාපේක්ෂව මෙම කුල ව්‍යුහයේ ධූරාවලිය වෙනස්කම්වලට ලක්ව ඇත. ඇතැම් කාලෙක ධූරාවලියෙහි ඉහළ ස්ථානයන් නියෝජනය කල කුල පසුකාලීනව එම ධූරාවලියෙහි පහළ මට්ටම් වලට පත්ව ඇත. එසේ කුල ධූරාවලියෙහි ආස්ථානයන් තීරණය කිරීමේ පරම බලයක් පැවතුනේ මෙරට පාලනය කල රජවරුන්ට වේ. ඒ අනුව රාජ නියෝගයන් මත මෙම කුල ධූරාවලිය විටින් විට විවිධ වෙනස්කම්වලට ලක්ව ඇත. එමෙන්ම සමස්ථයක් ලෙස ගත විට සිංහල කුල ක්‍රමයෙහි පවතින්නා වූ ප්‍රබලතම වෙනස්කම වන්නේ ප්‍රාදේශීය වශයෙන් දැකගතහැකි විශමතාවයන්ය. ඒ අතරෙහි උඩරට හා පහතරට ලෙසින් මෙරට කුල ව්‍යුහය තුළ දැකගත හැකි විශමතාවය ප්‍රධාන වේ.

**මහනුවර යුගයේ සමාජ සංවිධානය හා සිංහල කුල ක්‍රමය**

ඉහත සාකච්ඡා කල අන්දමට මෙරට කුල ව්‍යුහය සංවිධානය වීමෙහිලා බලපෑම් කරනු ලැබූ ප්‍රධානතම සාධකයක් වන්නේ පරිපාලනමය අවශ්‍යතාවයන්ය. ඒ අනුව මෙරට කුල ක්‍රමය ව්‍යුහගත වී ඇත්තේ වැඩවසම් සමාජ ආකෘතියක් ඔස්සේ ය. සිංහල කුලක්‍රමයෙහි මෙම වැඩවසම් ආකෘතිය වඩාත්ම ඉස්මතු කොට හඳුනාගත හැක්කේ මහනුවර යුගය තුළිනි.

දහසයවන සියවස අවසානයත් සමඟ පහතරට රාජධානි බිඳ වැටීමෙන් පසු එයටම ආවේණික හා අනන්‍ය වූ සමාජ, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික ආකෘතික රාමුවක් ඔස්සේ උඩරට රාජධානිය ස්වාධීන රාජ්‍යයක් ලෙසින් ගොඩනැගිනි. මෙම ආකෘතිය රඳාපැවැත්ම හා ශක්තිමත්භාවය තීර්ණය කරනලද සමාජ ප්‍රපඤ්චය වූයේ කුල ක්‍රමයයි. ඒ මත මහනුවර යුගයේ සමාජ සංවිධානය හා ඒ මත හැඩගැසුණු වෘත්තීමය කුල ධූරාවලියක් හඳුනාගත හැකිවිය. මෙම කුල ආකෘතිය පරිපාලනයේ ඉහළම ඒකකයන්හි සිට කුඩාම ඒකකය වූ ගම දක්වාම විහිද පැවතිනි.

**මහනුවර යුගයේ සමාජ සංවිධානය**

පුරාණ උඩරට සමාජ සංවිධානයෙහි පදනම් ඒකකය ගම වූ අතර එතුළ ගොවිතැන පදනම් කොටගත් කෘෂිකාර්මික අර්ථ රටාවක් හඳුනාගත හැකිවූ අතරම ස්වයංපෝෂිත ඒකකයක් විය. එහි සියලු සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික කාර්යදාමයන් තුළ කේන්ද්‍රීයම සාධකය වුයේ කුලයයි. එය උඩරට වැසියාගේ උපතේ සිට මරණය දක්වා වූ සියලුතම කාර්යයන්හි පාලනයන් හා මෙහෙයවීම සිදුකරන ලද ගාමක බලවේගය විය. රාජ්‍ය පරිපාලනය කුලය මත ගොඩනැගුණු රජු හා නිලධාරීන් පැලැන්තියක් මගින් සමස්ත රාජ්‍ය පරිපාලනය සිදුවූ අතර එය පහළම මට්ටමේ පරිපාලන ඒකකය වූ ගම තුළින්ද හඳුනාගත හැකිවිය. උඩරට රාජධානියෙහි පුරාණ ගම තුළ ඉහළ කුලයකට අයත්වූවන් ගම මධ්‍යයෙහි ජීවත් වූ අතර අවශේෂ කුලයන් ඈතින් ජීවත් විය. මෙම ගම මධ්‍යයෙහි ජීවත් වූවන් විසින් ගමෙහි පරිපාලනය සිදුකරන ලදී. කුලය යන්න ආරෝපිත සාධකයක් වූ අතර ඉන් පුද්ගලයාට හිමි සමාජ තත්ත්වය, රැකියාව මෙන්ම ගමද නිරූපණය විය. උඩරට වැසියාගේ වාසගම හෙවත් පවුලේ නාමය තුලින් ඔහුගේ තරාතිරම, මීමුතු පරපුර හා පවුලේ ඉතිහාසය පහසුවෙන් හඳුනාගත හැකිවිය. පුරාණ ගම තුළ කෘෂි කටයුතුවල නියැලී "ගොවිගම" කුලයට ප්‍රබල තැනක් හිමිවිය. අවශේෂ කටයුතු සඳහා එනම් රෙදි සේදීම, බෙර වාදනය, කම්මල් වැඩ වැනිදෑ සඳහා කුල පද්ධතියක් පැවතිණි. ඒ අනුව උඩරට සමාජයෙහි ගොවිගම කුලය ප්‍රමුඛ කොටගත් කුල ධූරාවලිය ප්‍රමුඛ සාධකයක් විය. එය පුරාණ උඩරට සමාජයෙහි සියලු සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික ක්‍රියාකාරකම් මෙහෙයවන්නා වූ හා කළමනාකරණය කරන්නා වූ සාධකය විය. එය පැරණි උඩරට සමාජයෙහි පැවතී පවුල, විවාහය, ඥාතීත්වය හා ඉඩම් භුක්තිය, අර්ථ ක්‍රමය, ආගම හා අධ්‍යාපනය හා පරිපාලනය ඔස්සේ පැහැදිලි වේ.

**පවුල හා පවුලේ කෘත්‍යයන්**

පුරාණ උඩරට සමාජය තුල සම්ප්‍රදායික සිංහල පවුල විස්තෘත පවුලක් විය. එය ස්වාමියා, භාර්යාව හා ස්වකීය දරුවන්ට අමතරව පියපස හෝ මව්පස ඥාතීන් කිහිපදෙනෙකුටද රැකවරණය ලබාදුන් ඒකකයක් විය. ඊට අයත් ඥාති කණ්ඩායමේ පොදු පදිංචිය මූලික ලක්ෂණයක් විය. දෙමාපියන්ට අමතරව විවාහයට පත් සිය දරුවන්ගේ පවුල්ද, වෙනත් ඥාතින්ද එම නිවසෙහි ම හෝ ඊට අයත් භූමියෙහි පදිංචි විය. මෙම විස්තෘත පවුලේ කටයුතු ඊට අයත් ඉඩම් හා ඉඩම් භුක්ති ක්‍රමය මත රඳා පැවතී අතර

පවුලේ සාමාජිකයන් අතර තදාත්මිය බැඳීමක් විය. පුරාණ ගමක පැවති සම්මතය වූයේ සමකුල විවාහය තුලින් පවුලක් ගොඩනගා අනතුරුව ලිංගික සබඳතා පැවැත්වීමයි. මෙය තුල කුලයෙන් පරිබාහිර පූර්ව වෛවාහික ලිංගික සබඳතා මෙන්ම පරිවෛවාහික ලිංගික සබඳතාද තහනම් විය. කෘෂි රටාව හේතුකොට පුරාණ ගැමි කතුන් විශාල පවුලකට වැඩි කැමැත්තක් දැක්විය. දාරක සමජානුයෝජනයේ කේන්ද්‍රස්ථානයද පවුල විය. එහිදී ස්වකීය ඥාති සමූහයා අතර දරුවා දැඩි සමාජානුයෝජනයකට ලක්විය. එබැවින් සාරධර්ම, ප්‍රතිමාන, හැසිරීම් පිළිබඳව මනා අවබෝධයක් හා පුහුණුවක් ලබාදීමෙහිලා එය කේන්ද්‍රීය සාධකයක් විය.

උඩරට පවුල තුලින් ඉටුවූ සුවිශේෂී කාර්යයක් වුයේ අධ්‍යාපනයයි. මෙහිදී කිසියම් සමාජ දේහයක් සතුව පවත්නා සුවිශේෂී චර්යාධර්ම පද්ධතීන්, සම්ප්‍රදායන් හා චින්තන ධාරිතාවයන් අනෙකුත් පරම්පරාවන් කරා සංජානනය කිරීමේ කාර්යය මෙකී අධ්‍යාපන කෘත්‍යයට අයත් වේ. බොහෝ දුරට විස්තෘත පවුල් වලින් සමන්විත පුරාණ ගම තුළ දරුවන් සමාජානුගත කිරීමේ හා ඔවුන්ගේ ඥාන මණ්ඩලය පෝෂණය කිරීමේ කාර්යය පළමු පරම්පරාවේ වැඩිහිටියන් විසින් ඉටුකරනු ලබයි. එබැවින් සමාජයෙහි විස්තෘත පවුල දාරක සමාජානුයෝජයේ කේන්ද්‍රස්ථානය විය. සම්ප්‍රදායිකව විස්තෘත පවුලක් වූ එහි ස්වකීය ඥාති සමූහයා අතර දරුවා දැඩි සමාජානුයෝජනයකට ලක්විය. එබැවින් සාරධර්ම, ප්‍රතිමාන, හැසිරීම් පිළිබඳව මනා අවබෝධයක් ලබාදීමෙහි ලා එය කේන්ද්‍රීය සාධකයක් විය. සමහර විටක දෙමාපියන් ස්වකීය ආර්ථික අරමුණ සාධනය කොටගන්ම උදෙසා වෙනත් ප්‍රදේශ වලට සංක්‍රමණය වුවද එය දාරක සමාජානුයෝජනයට බාධාවක් නොවූයේ එබැවිනි. අනෙක් අතට සම්ප්‍රදායික ලංකා සමාජයෙහි දැකගත හැකිවූ ලක්ෂණයක් වූයේ පියාගේ රැකියාව දරුවාට හිමි වීමයි. එහිලා අවශ්‍යය ශක්‍යතාවයන් හා හුරුකිරීම් දෙමාපිය ඇසුරෙහි නිතැතින්ම දරුවාට ලැබිණි. "ගමක ගොවියෙක්, වඩුවෙක්, පෙදරේරුවෙක්, වෙදමහත්මයෙක් හැමවිටම දරුවන් සමග ජීවත් වන අතර ඔවුන්ගේ රැකියාවේ අත්දැකීම් දරුවාට ඉගැන්වූ අතර පියා අනුගමනය කිරීමට දරුවාට ඉඩ සැලසුනු හෙයින් දරුවන් බොහෝ විට පියාට අනුව නායකත්වය හා පෞරුෂත්වය ගොඩනගා ගනු ලැබීය."[12]

එමෙන්ම සාම්ප්‍රදායික උඩරට සමාජය ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික සමාජයකි. එහිදී සමස්ත ආර්ථිකයේම අධෝ ව්‍යුහය නිර්මාණය වුයේ ගැමි කෘෂිකර්මාන්තය මත පදනම්වය. එබැවින් ග්‍රාමීය පවුලෙහි මූලික පදනම වූයේ කෘෂි අර්ථ රටාවකි. ඒ අනුව පවුලෙහි සාමාජිකයන් ස්වකීය වයස් සීමාවන්ට යටත්ව කෘෂි කටයුතු වල නිරත වූ අතර සාමාජිකයන් විශාල පිරිසකගෙන් සමන්විත විස්තෘත පවුල එහිලා ප්‍රබල මෙහෙවරක් ඉටුකරන ලදී. මෙසේ උඩරට සමාජය තුල කෘෂිකර්මාන්තය පදනම් කොටගත් අර්ථ රටාවන් ක්‍රියාත්මක වීම හේතුකොට එහි නිෂ්පාදනයන් සියලු දෙනා පොදුවේ භුක්ති විඳීම තුලින් ආර්ථික සහයෝගිතා කෘත්‍යය ක්‍රියාත්මක විය. "පවුල පදනම් කරගත් කෘෂිකාර්මික කටයුතු වල නිරත වන අවස්ථා වලදී මුළු පවුලේම සාමාජිකයන් ආර්ථික මට්ටමට යම් මට්ටමකින් සහය වනු ඇත, මෙසේ සහභාගි වීම තුළින් ලබාගන්නා ආදයම් හෝ නිෂ්පාදන පොදුවේ පරිභෝජනය කිරීමක්ද ආර්ථික සහයෝගිතා කෘත්‍යයෙන් අදහස් වේ''.[13]

මේ අනුව උඩරට ග්‍රාමීය පවුලෙහි ප්‍රධානතම ආර්ථික කටයුත්ත හා ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය වූ අතර පවුලේ පරිභෝජනයට අවශ්‍යය කරන්නා වූ දෑ එතුලින්ම නිෂ්පාදනය කරගන්න ලදී. එනම් පවුල නිෂ්පාදන ඒකකයක් ලෙස ක්‍රියාත්මක විය. ඒ අනුව පවුල තුළ දෘඩ කාර්යයන් එනම් කෘෂි කටයුතු වල නිරත වීම, හේන් වගාව, නිවාස ගොඩනැංවීම වැනි කාර්යයන් පුරුෂයාටත් දරුවන් රැකබලා ගැනීම, ගොවිතැන් කටයුතු වලට සහය වීම (ගොයම් කැපීම, එළවළු එකතු කිරීම ) වැනි සුමට කාර්යයන් සඳහා ශ්‍රමය යෙදවීම ස්ත්‍රියටත් හිමිවිය. ඒ අනුව පැරණි උඩරට පවුලෙහි සාමාජිකයන් යැපුම් ආර්ථිකයක් මත පදනම්ව සහයෝගිව කටයුතු කර ඇත.

## විවාහය

සම්ප්‍රදායික සමාජයෙහි අනුමත ලිංගික සබඳතාවක් වූයේ සමාජීය වශයෙන් පිළිගත් වයස සීමාවක් එළඹ පවත්නා සමාජ සම්ප්‍රදායනට යටත්ව විවාහවීමෙන් අනතුරුවය. ඒ අනුව අන්‍යන් කෙරෙහි පරාධීන නොවී ස්වාධීන ලෙසින් තම ජීවිතය හැඩගස්වාගෙන පවුල්ගත වූ පසු ලිංගික කටයුතු

12 හේරත්, 1999

13 ගමගේ , 1985.

වල යෙදීම සුදුසු විය. ඒ අනුව පූර්ව වෛවාහික ලිංගික සබඳතාත්, පරිවෛවාහික ලිංගික සබඳතාත් සමාජ විරෝධී මෙන්ම සදාචාරයට පටහැනි විය. සමාජ තහංචි විය.

පුරාණ උඩරට සමාජයෙහි විවාහය යන්න සිදුවූයේ කුලය, ඥාතීත්වය හා පවුල් සංස්ථාවේ තීරණ මතය. විවාහයේදී කුලය, ආගම හා ජාතිය සැසඳීම අත්‍යවශ්‍ය සාධකයක් විය. එමෙන්ම තවදුරටත් එහිදී කුලය,චරිතය,ආරක්ෂාව,අධ්‍යාපනය,වස්තුව,රූපය හා සෞඛ්‍යය යන කරුණු ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගෙන ඇත. එමෙන්ම ලාංකීය පැරණි උඩරට සමාජය තුළ කුලය පදනම් කොටගත් විවාහය හරහා අපේක්ෂිත වූ ප්‍රධාන අරමුණු දෙකක් විය. එනම් තම සමාජය තවදුරටත් ගෙන යාමට අවශ්‍ය දාරක පරම්පරාවක් නිර්මාණය හා දෙපර්ශවයන්හි බන්ධු කොටස් අතරෙහි ඥාති සබඳතාවයන් ආරම්භයයි.[14]

පුරාණ සිංහල නීතිය හා සමාජ භාවිතය අනුව ක්‍රියාත්මක වූ ප්‍රධාන විවාහ ක්‍රම දෙකකි. එනම් දීග විවාහය හා බින්න විවාහයයි.[15] පුරාණ ගම තුල විවාහය සිදුවීමේ සාමාන්‍ය ක්‍රමය වූයේ දීග විවාහයයි. ස්ත්‍රියට දෑවැද්දක් ලැබුණු අතර එය චංචල දෙපළකි. ඉඩම් බහුලව පවතින මුත් ඒවාහි පාලන හා වගා කටයුතු කරගෙන යාමට අවශ්‍ය තරම් පිරිමි නොසිටි පවුලක ස්ත්‍රියක හා පුරුෂයකු අතරෙහි බින්න විවාහය සිදුවිය. කෙසේ නමුත් වඩා ප්‍රචලිත විවාහ ක්‍රමය වූයේ ඇවැස්ස නෑනා හා මස්සිනා අතරෙහි පවතී විවාහයයි. මෙම විවාහ ක්‍රමයෙහි පැවති මුඛ්‍ය අරමුණක් වූයේ පවුලට අයත් දේපල බෙදී යාම හෝ පවුල තුළම තවදුරටත් රඳවා ගැනීම හා ඥාතීත්වය තවදුරටත් තහවුරු කරගැනීමයි. තවත් විවාහ ක්‍රමයක් වූයේ එකගෙයි කෑමයි. උඩරට ප්‍රදේශයන්හි බහුලව දැකගත හැකි වූ මෙම විවාහ ක්‍රමය තුල තරුණියක තමන්ගේම කුලයෙහි තරුණයකු හා ඔහුගේ සහෝදරයන්ගේ බිරිඳ බවට පත්විය.[16] අනෙක් අතට බහු පුරුෂ හා බහු භාර්යා විවාහ ක්‍රමද පැවතිනි. ප්‍රේම සබඳතා මත සිදුවූ විවාහයන් අල්ප වූ අතර විවාහය නීතිගත වීමක්ද බොහෝදුරට සිදුනොවීය.

**ඥාතීත්වය හා ඉඩම් භුක්තිය**

ලාංකීය උඩරට සමාජය තුල සමාජ සංවිධානයේ පදනම ඥාතීත්වය වූ අතර එමෙන්ම පවුල් ව්‍යුහය තුල ඥාතීත්ව ජාලය ඉතා වැදගත් විය. එහිදී එක් කුලයකට අයත් පිරිස ඥාතීන් ලෙස සැලකුණු අතර විශේෂයෙන්ම විස්තෘත පවුල් ක්‍රමය තුල ඥාතීත්වයට විශේෂ තැනක් හිමිවිය. එතුල ස්වකීය පරම්පරාවනට අගෞරව වන ආකාරයෙන් යමෙක් ක්‍රියා කලේ නම් එකී පුද්ගලයා සමග පවතින ඥාති සබඳතාවයන් නවතා දැමීමට මෙන්ම මරණ දඬුවම ලබාදීමට තරම් එම ඥාතිත්වය ප්‍රබල විය.[17]

අනෙක් අතට පුරාණ ගම තුල විවාහය, උපත, වැඩිවිය පැමිණීම, දරුවන් රැක බලා ගැනීම හා මරණය යන මානව ජීවිතයේ සියලු සුවිශේෂී අවස්ථාවන්හිදී මෙකී ඥාතීත්වය සුවිශේෂී භූමිකාවක් නිරූපණය කරන ලදී[18]. අනෙක් අතට මෙවැනි සමාජ අවස්ථාවන් පුරාණ ගමෙහි ඥාතීත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙන්ම තහවුරු වීමට තීරණාත්මක ලෙසින් බලපාන ලදී.

අනෙක් අතට උඩරට ඉඩම් භුක්තියෙහි පදනම වූයේද ඥාතීත්වයයි. පුරාණ ලංකාවේ ගම තුල ඉඩම් ප්‍රධාන වශයෙන් ගොඩ ඉඩම් හා කුඹුරු ඉඩම් ලෙසින් දෙයාකාර විය. එයට අමතරව පුරාණ ගමෙහි ඉඩම් පරවේණි, සින්නක්කර හා බද්ද ඉඩම් ලෙසින් තෙයාකාරව හඳුනාගත හැක.[19] ඉඩම්වල උරුමය පාරම්පරික වූ අතර ඒවා පරවේණි ඉඩම් නම් විය. එම ඉඩම් බෙදීම පරවේණි බෙදීම නම් වූ අතර ඒවා "පංගු" නම් විය. අනෙක් අතට දේපල හිමිවීමේදී පීතෘ මූලික සමාජයක් පිය පේරුවේ ඥාතීන්ට ඉඩම්වල අයිතිය හිමිවිය.

---

14 අමුණුගම, 1977.

15 ආර්.පීරිස්, **සිංහල සමාජ සංවිධානය.** (බොරලැස්ගමුව :විසිදුනු ප්‍රකාශකයෝ 2001).

16 කුමාර, 1997.

17 එම., 1997.

18 අමුණුගම, 1977

19 E.R.Leach **"Aspects of Caste in South India"** (Celon and North West Pakisthan Cambridge Papers in Social Antropology1971)

### අර්ථ ක්‍රමය

උඩරට පුරාණ ගම කෘෂි අර්ථ රටාව මත පදනම් වූ ස්වයංපෝෂිත ඒකකයකි. එසේම එය නිෂ්පාදන් ඒකකයකි. ඒ අනුව පරිභෝජනයට අවශ්‍ය දෑ ගම තිලම නිෂ්පාදනය විය. වැඩවසම් අර්ථක්‍රමයක් මත පදනම් වූ අර්ථ ක්‍රමයේ ඉහළම අගයක් භූමියට හිමිවිය. එයද කුල ස්තරායනය මත පදනම්විය. මුදල් හුවමාරුව බහුලව නොපවතී අතර එක් එක් තැනැත්තා තම තමන්ගේ ජීවිකාව රැකගත්තේ ගොවිතැනින් හා තම අතිරික්තයන් අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සමඟ හුවමරුවෙනි. එබැවින් ශ්‍රම හුවමාරුව සිදුවූ අතර මුදල අවැදගත් විය. ඇඳුම්, පැළඳුම්, ලුණු වැනි දෑ ගමටම වෙළඳුන් ගෙන ආ අතර ඒවාද භාණ්ඩ හුවමාරුවෙන් සිදුවිය.

### ආගම හා අධ්‍යාපනය

මහින්දාගමනයත් සමඟ මෙරට වැසියාගේ සමාජ ජීවන රටාව මහත් පරිවර්තනයන්ට ලක්විය. එහිලා පන්සල සුවිශාල කාර්යභාරයක් සිදුකල අතර ග්‍රාමීය බෞද්ධයාගේ ලෞකික, අලෞකික ඕනෑකම් ඉටුකරගැන්මට අවශ්‍ය බලය රාශිභූතව පවතින කේන්ද්‍රස්ථානයක් විය. එබැවින් පැරැණි උඩරට ගම තුළ පන්සල බහුකාර්ය මධ්‍යස්ථානයක් විය.

සම්ප්‍රදායික උඩරට සිංහල සමාජයෙහි සෑම අංශයක්ම ක්‍රියාත්මක වූයේත් ද්‍රවීකරණය වී පැවතියෙත් පන්සල කෙන්ද්‍රකොටගෙනය. එහිදී පුරාණ ගමෙහි අධ්‍යාපන කේන්ද්‍රස්ථානය වූයේ පන්සලයි. එය නිදහස් අධ්‍යාපනයකි. දරුවට අකුරු කියවන මුල්ම සමාජානුයෝජනය පන්සල මුල්කොට පැවතිනි. ඒ අනුව ආගමික මෙන්ම ආගමික නොවන අධ්‍යාපනයද පන්සල කෙන්ද්‍රගතකොටගෙන පවතී අතර ඉරුදින දහම්පාසැල්, පිරිවෙන් අධ්‍යාපනය ප්‍රබල විය. පුරාණ ගම මේ හේතුකොට සාරධර්ම අතින් දියුණු හා ගුණාත්මක ඒකකයක් විය. එමෙන්ම ගම තුල ඇතිවන ගැටළුවලට විසඳුම් ලබාදීමට මැදිහත්වීමෙන් ගම හා පන්සල අතර බැඳීම් වඩාත් ශක්තිමත් විය. ගමත් පන්සලත් අතර බැඳීම් වැඩිකල තවත් කරුණක් වූයේ වෛද්‍ය ශාස්ත්‍රයයි.

මේ අයුරින් පුරාණ ගම තුල පන්සල එක්තරා අන්දමට අධ්‍යාපන මධ්‍යස්ථානයක්. වෛද්‍ය මධ්‍යස්ථානයක් හා ගැටළු නිරාකරණය කරනු ලබන මධ්‍යස්ථානයක් විය. එසේම ගැමියාගේ උපතේ සිට මරණය දක්වා වන සෑම වැදගත් අවස්ථාවකදීම බෞද්ධ භික්ෂුව ජන ජීවිතයට සමීපව කල්ගෙවන ලදී. දරුවකු කුස තුල පිළිසිඳ ගත අවස්ථාවේ ආශීර්වාදය ලබාගැන්මේ පටන් ඔහුට අකුරු කියවීම, නම් තැබීම, සෙත්පිරිත් කීම, ශුභ මූර්ති සැකසීම, පාංශුකූලය දීම, ආදී කුඩු මහත් සෑම කටයුත්තකදීම ගැමියා හා පන්සල අතර අන්‍යෝන්‍ය සබඳතාවයක් විය. මේ අනුව පුරාණ ගමෙහි පන්සලේ කාර්යභාරය විවිධ අංශ කෙරෙහි පැතිර ගිය බව පෙනේ.

### පරිපාලනය

පුරාණ ගමෙහි පැවතියේ සරල සමාජ රටාවක් වන අතර ගැමියන් සම්මත සම්බන්ධතා සමූහයක් හා නීති-රීති, අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව පොදු විශ්වාස පද්ධතියක් ක්‍රියාත්මක විය. එබැවින් ගමේ පරිපාලනය සිදුවූයේ ගම තුලින්ම වන අතර පන්සලේ හාමුදුරුවන් එහි ප්‍රධාන භූමිකාවක් විය. අනෙක් අතට ගමෙහි පරිපාලනය උදෙසා උඩරට ප්‍රදේශවල "ගම්සභා"ත් නුවර කලාවියේ "රටසභා" ත් ක්‍රියාත්මක විය. මෙයට අමතරව වරිගසභා ක්‍රමය පැවති අතර එහි මූලිකත්වය ගමෙහි තලතුනා පුද්ගලයන් විසින් ගන්නා ලදී. නායකයන් ගමරාළ, ගමමහේ, වෙල්විදානේ, කෝරාළ, උණ්ඩියරාළ ආදීන් වූ අතර එය ප්‍රාදේශීය වශයෙන් වෙනස්විය. නායකයන් කුල සාධකය පදනම්කොටගෙන පාරම්පරිකව පත්විය. එමනිසා ගමතුල පැන නැගී ආරවුල් ඔවුන් විසඳූ අතර නුවර කලවියේදී බරපතල සාපරාධී ක්‍රියා, කුල සම්බන්ධ අරගල විනිශ්චය සඳහා රටසභා නම් අධිකරණ විශේෂයට ඉදිරිපත් කරන ලදී[20]. ගමේ නායකයන් මෙන්ම වරිග සභා ආදියෙහි තීරණ ගම්වැසියන් විසින් ඉහලින්ම පිළිගන්නා ලද අතර එබැවින් ගමෙහි පරිපාලනය එතුලම සිදුවිය.

---

20 ආර්.පීරිස්, සිංහල සමාජ සංවිධානය. (බොරලැස්ගමුව :විසිදුනු ප්‍රකාශකයෝ 2001).

## කුලය හා වෘත්තීය ධුරාවලිය

කුලය පුරාණ උඩරට සමාජයෙහි සියළු සමාජ, ආර්ථික. දේශපාලනික හා සංස්කෘතික ක්‍රියාකාරකම් මෙහෙයවන්නා වූ හා කළමනාකරණය කරන්නා වූ සාධකය විය. එය උඩරට වැසියාගේ උපතේ සිට මරණය දක්වා වූ සියලුතම කාර්යයන්හි පාලනයන් හා මෙහෙයවීම සිදු කරන ලද ගමක බලවේගය විය. කුලය යන්න ආරෝපිත සාධකයක් වූ අතර ඉන් පුද්ගලයාට හිමි සමාජ තත්වය, රැකියාව, ගම ආදිය නිරූපණය විය. පුද්ගලයකුගේ වාසගම හෙවත් පවුලේ නාමය තුලින් ඔහුගේ තරාතිරම, මීමුතු පරපුර හා පවුලේ ඉතිහාසය පහසුවෙන් දැනගත හැකිවිය.

අනෙක් අතට මෙම කුල ආකෘතිය හා කුල වැඩවසම් ක්‍රමය උඩරට සමාජයට අවේනික වූ දෙයක් විය. එය ඉඩම් භුක්තිය බැඳී පැවතිණි. උඩරට අර්ථක්‍රමය කෘෂිකර්මාන්තය හා බැඳී පවතී අතර රජු උඩරට වැසියා වෙනුවෙන් ආරක්ෂාව සපයන්නා විය. ඒ වෙනුවෙන් උඩරට වැසියා අනිවාර්ය දින ගණනක් රජු වෙනුවෙන් සේවය කලයුතු විය. අනෙක් අතට රාජ්‍ය පරිපාලනය හා අර්ථ ක්‍රමය කුලය මත පදනම් විය. ඒ අනුව විවිධ වූ රාජ්‍ය සේවාවන් ලබාගැනීම සඳහා ඒ ඒ කුල වෙනුවෙන් වෙන්වූ නිශ්චිත සේවා හා කාර්යභාරයන් පැවතිණි. එහිදී පරිපාලනමය හා කෘෂි කටයුතුවල නියැලී "ගොවිග ම" කුලයට ප්‍රබල තැනක් හිමිවිය. අවශේෂ කටයුතු සඳහා එනම් රෙදි සේදීම, බෙර වාදනය, කම්මල් වැඩ වැනි දෑ සඳහා කුල පද්ධතියක් පැවතිණි. ඒ අනුව ගොවි කුලය ප්‍රමුඛ කොටගත් කුල ධුරාවලිය හා බැඳුනු වෘත්තීය රටාව පුරාණ උඩරට සමාජය තුළ ප්‍රමුඛ ලක්ෂණයක් විය.

## ගොවිගම කුලය

උඩරට කුල ධුරාවලියෙහි ඉහලම අංශය නියෝජනය කරනු ලැබුවේ ගොවිගම කුලය වේ. එය උඩරට සමාජයෙහි බහුතරයක් දෙනා නියෝජනය කල කුලය වේ. රජු වෙනුවෙන් කරනු ලැබූ සේවාවන් පදනම් කොටගනිමින් මෙම ගොවිගම කුලය තවත් ප්‍රභේද කිහිපයකින් යුක්ත විය. ඒ අතරෙහි ප්‍රමුඛතම කොටස "රදල" විය. ඔවුන් රාජ්‍ය පාලනයේ උසස් තනතුරු දැරීමට මෙන්ම එම සේවාවන් වෙනුවෙන් ඉඩම් හිමිකම් ලැබූවන් වේ. "මුදලි" යනුද එසේම රාජ්‍ය සේවය උදෙසා තනතුරු හා ඉඩම් හිමිකම් ලැබූවන් වේ. මෙම දෙපාර්ශ්වයම ගොවිගම කුලය තුළ ඉහළම ස්තරයනය නියෝජනය කල කුල ප්‍රභේදයන් විය. ඔවුන් රජු වෙනුවෙන් සේනා සංවිධානය, රාජකාරි සේවා සංවිධානය, විශාල නින්දගම් හා පරවේණි ඉඩම් පරිපාලනය, ප්‍රාදේශීය අධිකරණ කටයුතු මෙම කුල විසින් සිදු කරන ලදී. ගොවිගම කුලයේ තෙවන මට්ටම පයින්ඩපේරුව හෙවත් රටේ ඇත්තන් විය. ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තයෙහි නියැළුණු මෙම කොටස උඩරට රාජ්‍යයෙහි හමුදා සේනාංකයන්හි විවිධ තනතුරු මෙන්ම බහුතර සාමාජිකත්වය දරන ලදී. ගොවිගම කුලයෙහි තවත් උප කොටසක් ලෙස හඳුනාගත හැක්කේ "පට්ටි" මෙම කොටස ප්‍රධාන වශයෙන් ගව පාලනයෙහි යෙදෙන ලදී.

සමස්ථයක් ලෙසට මහනුවර යුගයෙහි කුල ධුරාවලිය තුළ ඉහළම ස්තරය ගොවිගම කුලය නියෝජනය කරන ලද අතර සංඛ්‍යාත්මකව සමස්ත ජනගහනයෙන් අඩක්ම මෙම කුල සාමාජිකයන් නියෝජනය කරන ලදී. ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්මාන්තය හා බද්ධ වූ මොවුන්ගේ කාර්යභාරයන් එතුළ විවිධ විය. නිදසුනක් ලෙස ගොවිගම කුලයෙහි ඉහල ප්‍රභේදයන් වූ රදල හා පට්ටි කොටස් නින්දගම් හා පරවේණි ඉඩම් විශාල, සංඛ්‍යාවක හිමිකාරිත්වය දරන ලද අතර ඒවා පරිපාලනය කිරීම සිදුකරන ලදී. මෙම ගොවිගම කුලයෙහි බහුතරය නියෝජනය කල "ගොවි" කොටස ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තයෙහි නිරත වන ලදී. එමෙන්ම මෙම ගොවි කුල සාමාජිකයන් අනෙකුත් කුලයන් වෙතට වෘත්තීමය වශයෙන් හෝ වෙනත් අන්දමකින් අනෙකුත් කුල වෙත සේවාවන් සිදු නොකරන ලදී.

## නවන්දන්නා කුලය

මහනුවර යුගයේ කුල ක්‍රමය තුළ ශිල්පිය කුලයක් ලෙසට නවන්දන්නා කුලය හඳුනා ගත හැක.ප්‍රධාන වශයෙන් ගෘහ භාණ්ඩ, කෘෂිකාර්මික හා අවි ආයුධ තැනීමෙහි ප්‍රවීනයන් වූ මෙම කුලය හීන කුලයන් අතර ඉහල මට්ටම[21] නියෝජනය කල අතරම තම සේවාවන් උදෙසා උඩරට රජුගෙන් සේවා ඇගයුමට ලක්වූවන් විය.[22] ශිල්පීය ප්‍රවීණත්වය අනුව කුල ප්‍රභේදයන් කිහිපයක එකතුවක් මෙම

21 Ryan,1953.

22 Yalman, 1960.

"නවන්දන්නා" කුලය තුළ අන්තර්ගත විය. ඒ අනුව රන් හා ඒ ආශ්‍රිත කර්මාන්තයන්හි නියැලෙන්නන් ආචාරීන් ලෙසත් යකඩ හා වානේ කර්මාන්තයන්හි නියැලෙන්නන් "ලෝකුරු" ලෙසත් නක්ෂත්‍රය ඇසුරෙහි ප්‍රවීණත්වයට පත්වූවන් "ගණිත" යන් ලෙසත් හැඳින්වීය. ඒ අනුව වෘත්තීමය මෙම කුලයන් උඩරට රාජ්‍යයේ පැවැත්මට අවශ්‍ය කෙරෙන්නා වූ කෘෂි හා යුධ උපකරණත් අනෙක් අතින් ඉහළ කුලයන්හි අනෙකුත් කෘෂි හා ගෘහ උපකරණ අවශ්‍යතාවයන් සපයන්නන් විය. එමෙන්ම ආගමික වශයෙන් වැදගත් උත්සව අවස්ථාවන්හිදී හා පන්සල් සඳහා මුතුකුඩ සේසත් ආදිය නිපැයීම සිදුවූයේ මෙම කුලයන් මඟිනි. එමෙන්ම දැව ආශ්‍රිත නිෂ්පාදන, පිළිම නෙළීම හා සිතුවම් ඇඳීම ආදියද වෘත්තීමය වශයෙන් මොවුනට හිමිවූ කාර්යභාරයන් විය. එමෙන්ම ඒ වෙනුවෙන් උඩරට රජු වෙනුවෙන් කොට්ටල් බද්ද යටතේ සංවිධානය වී තිබුණි.

### බත්ගම/ පදු කුලය

මහනුවර යුගයේ පැවති කුල ධුරවලියෙහි සේවා කුලයක් ලෙසට මෙම බත්ගම කුලය හැඳින්විය හැක. ශ්‍රමිකයන්ගෙන් සමන්විත කුලයක් ලෙසින් හඳුන්වා ඇති මෙම කුලය ප්‍රභූ දෝලාවන් ඔසවාගෙන යාම, පෙරහැර කටයුතුවලදී කොඩි ඔසවාගෙන යාම මෙන්ම උඩරට රාජ්‍යයෙහි යුධ කටයුතුවලදී අවශ්‍ය සේවාවන් සැපයීම සිදුකර ඇත[23]. මෙහෙකාර කුලයක් ලෙසට හැඳින්වූවත් මෙම කුල සාමාජිකයන් ඉහල කුලීනයන්ගේ නිවෙස් තුළ මෙහෙකාර සේවාවන් සඳහා යොදාගෙන නැත.[24]පැරණි රජදවස රජවාසල ඉඩම් "බත්ගම්" ලෙසින් හඳුන්වා ඇති අතර මෙම බත්ගම කුල ජනය පදිංචිව සිට ඇත්තේ එම ඉඩම් තුළය. එමෙන්ම මෙම බත්ගම කුල ජනයා වෙනත් කර්මාන්තයක නිරත නොවූ රණකාමී කොටසක් ලෙසින් ප්‍රසිද්ධ අතර උඩරට රාජධානි සමයෙහි ගොවිතැනින් හා යුධ හමුදාවේ හේවාකම් සිදුකිරීම මඟින් තම වෘත්තීමය කාර්යභාරයන් ඉටුකොට ඇත (Knox.)[25].

### රදා/ රජක කුලය

මහනුවර යුගය තුළ වෘත්තීමය වශයෙන් මෙම කුලයට හිමිව පැවති කාර්යයන් අතර රජවාසල කාර්යයන් ප්‍රමුඛ විය. ඒ අනුව රජවාසල සඳහා පිරුවට සැපයීම, වියන් බැඳීම,පන්දම් හා විලක්කු සැපයීමත් අනෙක් අතින් ඉහල කුලීනයන්ගේ රෙදි සේදීම, අවමඟුල් හා මල්වර උත්සව අවස්ථාවන්හි රෙදි සේදීම, මල්වර යුවතියන් නැහැවීම හා සම්බන්ධ චාරිත්‍රයන් ඉටුකිරීම ප්‍රමුඛයා කාර්යයන් විය. එමෙන්ම මොවුන් තමන් හා සමතත්වයේ සිටි කුලයන් වෙනුවෙන් තම වෘත්තීය කාර්යයන් ඉටුනොකළ අතර සැම විටම තමනට වඩා ඉහල කුලයන් වෙනුවෙන් සේවා සැපයීය. එහිදී ඒ සඳහා වූ ගෙවීම් ලෙස ඉහල කුලීනයන්ගෙන් රෙදි, සහල් හා මුදල් හිමිවිය. එමෙන්ම රදා කුලයෙන් පහළ මට්ටමේ සිටි කුලයන්ගේ කටයුතු සිදුකිරීම "පලි" නම් කුලය විසින් සිදුකරන ලදී.

### වහුම්පුර/හකුරු කුලය

සකුරු, ශක ආරණ්‍යප, වංශ පූර්ණ, වහුම්පුර, සුදු කරා, සගරම්බු සහ කන්දේ ඇත්තෝ ලෙසින් උප කුල හතකින් සමන්විත මෙම කුලයේ ප්‍රධානතම කාර්යයන් වූයේ හකුරු නිෂ්පාදනය, ඉහල කුලීනයන්ගේ නිවෙස්වල මුළුතැන්ගෙයි කටයුතු සිදුකිරීම, උත්සව අවස්ථාවන්හි රසකැවිලි නිෂ්පාදනය ප්‍රධාන විය.[26] එහෙත් මෙම කුලයේ කටයුතු රාජ්‍ය පාලනය තුළ අනිවාර්ය හා විශේෂිත බලපෑමක් එල්ල කල හැකි අත්‍යවශ්‍ය සේවාවක් නොවීය.

### අවශේෂ කුලයන්

ඉහත සාකච්චා කල ප්‍රධාන කුලයන්ට අමතරව මහනුවර යුගය තුළ ක්‍රියාත්මක වූ අවශේෂ කුල කිහිපයක් පවතී. ඒ අතුරෙහි බඩහැල් හෙවත් කුඹල් කුලය විසින් වළන් සෑදීම තම වෘත්තීමය ජීවනෝපාය බවට පත්කරගෙන තිබුණි. ඔවුන් විසින් රජවාසලට මෙන්ම අනෙකුත් කුලවලට අවශ්‍ය මැටි ආශ්‍රිත නිෂ්පාදනයන් සිදුකරන ලදී. බෙරවා නම් කුලය මඟින් නර්තනය ජීවනෝපාය කරගත් අතර ආගමික පෙරහැරවල්වල බෙර වාදනය හා බලියාග පැවැත්වීම සිදුකරන ලදී.

---

23 කේ.ටී.සිල්වා, සහ තවත් අය. **කුලය, පන්තිය හා ලංකාවේ සමාජ ගැටුම්.** (බොරලැස්ගමුව:විසිදුනු ප්‍රකාශකයෝ 2005).

24 Ryan,1953.

25 Knox".

26 අයිවන්,1990

## සමෝධානය

මෙම ලිපියේ මුඛ්‍ය පරමාර්ථය වුයේ ලාංකීය සමාජයෙහි ඓතිහාසිකව විකාශනය වූ කුලය හා එය මහනුවර යුගය තුළ ක්‍රියාත්මක වූ ආකාරය පිලිබඳ කෙටි සමාලෝචනයක යෙදීමයි. මහනුවර යුගය යනු මෙරට ඓතිහාසික සමාජ විකාශනය තුළ එයටම අවේනික වූ හා අනන්‍ය වූ සමාජ ව්‍යුහයක් නිර්මාණය කරගත් කාල වකවානුවකි. එම අවධිය තුළ මෙරට කුලය යන්න වඩා විධිමත් ලෙසින් ආයතන ගත වූ අතර රාජ්‍යයේ විවිධ අවශ්‍යතාවයන් ඉටුකරගැනීම පිණිස තීර්ණය සාධකයක් ලෙසින් කුලය උපයෝගී කොටගෙන ඇත. ඒ අනුව ඒ ඒ කුල උදෙසා වෙන්වූ හා අනිවාර්ය වූ සේවාවන් නිර්මාණය විය. සමාජ ක්‍රමයේ පැවැත්ම මේ මත තීරණය වූ අතර ඒ ඒ කුලයන්ට අයත් සේවාවන් සමස්ත පද්ධතියෙහි ක්‍රියාකාරීත්වය කෙරෙහි අනිවාර්ය අවශ්‍යතාවයක් විය. එහෙත් පසුකාලීනව කන්ද උඩරට රාජධානියෙහි පැවැත්ම බ්‍රිතාන්‍ය පාලනයට නතු වීමත් සමඟ මෙතෙක් කුලය මත පදනම් වූ සමාජ ක්‍රමය බිඳවැටීමට ලක්විය. එහිලා 1833 කෝල්බෲක් කැමරන් ආඥාක්‍රමය මඟින් සිදුකල රාජකාරි ක්‍රමය අහෝසි කිරීම තීරණාත්මක සාධකයක් විය. කෙසේ නමුත් මහනුවර යුගය තුළ එයටම අනන්‍ය ලෙසින් නිර්මාණය වූ කුල වැඩවසම් ක්‍රමයෙහි නෂ්ඨාවශේෂයන් අදටද ලාංකීය සමාජයෙහි විවාහය වැනි සමාජ සංසිද්ධීන් තුළ ආවෘත සාධකයන් ලෙසින් ක්‍රියාත්මක වනු දැකිය හැක.